## 2000 අංක 06 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL INFORMATION TECHNOLOGY STATUTE NO; 06 OF 2000

බස්නාහිර පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වූ තොරතුරු හා දත්ත විධිමත්ව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගැනීමත්, පද්ධති හා ක්‍රම විශ්ලේෂණය හා සංවර්ධනයත්, පරිගණක අධ්‍යාපනය හා ඒ ආශ්‍රිත කටයුතු විධිමත් හා පුළුල් කිරීම සඳහා ද තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ලබාදීම සඳහාද හා ඊට අනුශාංගික කාරණා සඳහාද විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය 2000 අංක 06 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයා අනුමත කරන දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය. *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

### 1 වන කොටස

### බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය පිහිටුවීම

2. (1) මෙහි මින්මතු “ආයතනය” යනුවෙන් හඳුන්වනු ලබන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානය යනුවෙන් ආයතනයක් පිහිටුවනු ලැබේ. *බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය පිහිටුවීම.*

(2) මෙම ආයතනය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, (1) උප වගන්තිය මගින් පවරා ඇති නාමයෙන් ආයතනය විසින් හා ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකිය.

### 2 වන කොටස

### ආයතනයේ අරමුණු, බලතල හා කර්තව්‍යය

3. (1) ආයතනයේ අරමුණ පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) පළාත් සභාව සඳහා තොරතුරු තාක්ෂණය හා පරිඝණක කටයුතු පිළිබඳ සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

(ආ) තොරතුරු තාක්ෂණ සේවාවන් ජනතාවට ලබාදීම.

(ඇ) පළාත් සභාව තුළ ක්‍රියාත්මක වන ආයතනවල පරිඝණක අධ්‍යාපනය සහ පුහුණුවීම් විධිමත් කිරීම.

(ඈ) මෙම ප්‍රඥප්තිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු හා දත්ත එක්රැස් කිරීම හා පවත්වාගෙන යාම.

(ඉ) පළාත තුළ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි සමීක්ෂණ, පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීම.

(ඊ) මෙම ප්‍රඥප්තියේ විධි විධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සමීක්ෂණ, පර්යේෂණ හා අධ්‍යයනය පැවැත්වීම.

(උ) තොරතුරු තාක්ෂණය හා පරිඝනක විද්‍යාව පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(ඌ) පළාත තුළ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන කටයුතුවල නිරතව සිටින ආයතන වලට තාක්ෂණික මූල්‍ය හා වෙනත් සහායන් ලබාදීම.

(එ) මෙම ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු කටයුතු කිරීම.

(2) ආයතනයේ බලතල පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, ආයතනයට අවශ්‍ය උපකකාර්යාල හා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සහ ආයතනයේ කර්තව්‍යයන්ට සමාන කටයුතු කරන ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවල වෙනත් ආයතන හා සමග එක්ව කටයුතු කිරීම.

ආයතනයේ බලතල හා කර්තව්‍යය.

(ආ) ආයතනයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමට අදළ චංචල හෝ නිශ්චල දේපල අත්කර ගැනීම, භුක්ත විදීම, බද්දට හෝ කුලියට දීම, කුලියට ගැනීම, උගස් කිරීම, විකිණීම හෝ වෙනත් අයුරකින් බැහැර කිරීම.

(ඇ) ආයතනයේ පරමාර්ථ ඉටු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ගිවිසුම් හා කොන්ත්‍රාත්වලට එළඹීම.

(ඈ) ආයතනය මගින් සපයනු ලබන දැනුම, අධ්‍යාපනික වැඩසටහන් හා වෙනත් සේවාවන් සඳහා ගාස්තු නියම කිරීම, අයකිරීම හා ගෙවීම.

(ඉ) ආයතනයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම හා පත්කිරීම, උසස් කිරීමට අනුයුක්ත කිරීම, වැටුප් හා වෙනත් පාරිශ්‍රමික ගෙවීම, පරිපාලනය හා විනය කටයුතු පවත්වාගෙන යාම හා එකී කාර්යයන්ට අවශ්‍ය කොන්දේසි නීතිරීති හා රෙගුලාසි නියම කිරීම, සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

(ඊ) කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට විශේෂිත රාජකාරි පැවරීම හා

ඔවුන්ගේ කාර්යය සාධනය ඇගයීම හා ඊට අදාළ පියවර ගැනීම.

(උ) කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථ සාධක අරමුදලක් හෝ එවැනි යෝජනා ක්‍රමයක් පිහිටුවීමට කටයුතු කිරීම සහ එවැනිම අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා දයක වීම.

(ඌ) ආයතනයේ පරමාර්ථ ඉටු කිරීමට අවශ්‍ය වාහන,උපකරණ, යන්ත්‍ර සූත්‍ර, ලිපි ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය මිලට ගැනීම, ලබාගැනීම හා ආනයනය කිරීම,

(එ) පළාත් සභාවට පවරා දී ඇති නීතියේ ඉඩකඩ සීමා තුළ අරමුදල්, උපකරණ හා යන්ත්‍ර සූත්‍ර, වාහන, තාක්ෂණය, විශේෂඥ ඥණය හෝ වෙනත් ආධාර ලබාගැනීම, ඒ සඳහා දේශීය හා විදේශීය ආයතන සමග සාකච්ඡා කිරීම හා ක්‍රියාකිරීම.

(ඒ) ආයතනයේ කාර්යයන් ඉටු කිරීම, විධිමත් කිරීම, සංවර්ධනය කිරීම හා ඒ සඳහා සහාය ලබා ගැනීම සඳහා දේශීය ආයතන සමග සම්බන්ධ වීම, ඒකාබද්ධ වීම හා ඒ සඳහා ගාස්තු නියම කිරීම හා ගෙවීම.

(ඔ) පළාත් සභාවේ ආයතන වල පද්ධති හා ක්‍රම ඇගයීම, සංවර්ධනය කිරීම, වෙනත් ආයතන සහ පුද්ගලයන්ගේ සහාය ලබා ගැනීම හා ඒ සඳහා පාරිශ්‍රමික ගාස්තු නියම කිරීම හා ගෙවීම.

(ඕ) පළාත තුළ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධනය පිළිබඳ විශේෂ දේශණ, සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානය කිරීම හා පැවැත්වීම.

(ක) පුහුණුවන්නන් හා සේවා ලබන්නන් සඳහා අවශ්‍ය පහසුකම් හා සුභ සාධනය සැලසීම.

## 3 වන කොටස

(1) ආයතනයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය (මෙහි මින්මතු " මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයකට පවරනු ලැබිය යුතු අතර ඒ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය. කළමනාකරණ මණ්ඩලය

(අ) බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්වරයා

(ආ) බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යංශය භාර ලේකම්

(ඇ) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ලේකම් (මානව සම්පත් සංවර්ධන)

(ඈ) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ලේකම් (මූල්‍ය)

(ඉ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

(ඊ) බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පහත සඳහන් අයගෙන් පත් කරනු ලබන නියෝජිතයන් තිදෙනෙකු

i. තොරතුරු තාක්ෂණය හා පරිඝණක පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රවීණයකු

ii. තොරතුරු තාක්ෂණය සහ පරිඝණක පිළිබඳ මනා දැනුමක් හා අත්දැකීමක් ඇති රාජ්‍ය අංශයේ තැනැත්තෙක්

iii. තොරතුරු තාක්ෂණය සංවර්ධනය පිළිබඳ දැනුමක් ඇති හෝ උනන්දුවක් දක්වන හෝ එම කටයුතුවල යෙදී සිටින ජ්‍යෙෂ්ඨ පළාත් සභා නිලධාරියෙක්

(2) (අ) ප්‍රධාන අමාත්‍යවරයා විසින් මෙම සාමාජිකයන් අතුරින් එක් අයෙක් ආයතනයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය හැකි අතර ආයතනයේ අධ්‍යක්ෂවරයා නිලබලයෙන් මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය.

(ආ) (1) වන උප වගන්තියේ (ඊ) ජේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයෙකුගේ නිල කාලය අවුරුදු 03 ක් වන අතර, එම කාලය ඉකුත් වීම නිසා සාමාජිකත්වයෙන් ඉවත් වන තැනැත්තෙකු නැවත පත්වීම සඳහා සුදුස්සකු විය හැක.

(3) මණ්ඩලයේ යම් සාමාජිකයකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු වුවහොත් හෝ එවැනි තනතුරකට පත් වුවහොත් එසේ පත් වන දින සිට ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුස්සකු වන්නේය.

(4) මණ්ඩලයේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයෙක් :-

(1) 3 (3) වන උප වගන්තියෙහි සඳහන් කරන ලද යම් නුසුදුසුකමට යටත් වුවහොත් හෝ,

(2) කායික දුබලතාවය හෝ සිහි විකලතාවය හෝ රටින් බැහැරවීම හෝ වෙනත් යම් කරුණක් හේතු කොටගෙන ස්වකීය කාර්යයන් ඉටු කිරීමට නිත්‍ය වශයෙන්ම නොහැකි තත්ත්වයකට පත් වුවහොත් හෝ

(3) මණ්ඩලය අපකීර්තියට පත්වන අන්දමේ යම් ක්‍රියාවක් කර ඇති බව සනාථ වී ඇත්නම් අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කර ඒ වෙනුවට වැඩ බැලීමට වෙනත් තැනැත්තෙකු පත්කරනු ලැබිය හැක.

(3) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියකින් පත්කළ සාමාජිකයෙකුට සිය තනතුරින් ඉල්ලා අස්විය හැක. මණ්ඩලයේ බලතල

5. මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතුය.

(i) ප්‍රඥප්තියේ අරමුණ ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කිරීම හා ඒ සඳහා අවශ්‍ය වන්නා වූ සියලු පියවර ගැනීම.

(ii) මණ්ඩලයේ බලතල කාර්යයන් හා කර්තව්‍යයන් හෝ ඉන් කොටසක් යම් සීමා සහිත එහි සභාපතිට හෝ සාමාජිකයකුට හෝ පවරා දිය හැකිය. එකී කාර්යයන් හා කර්තව්‍යයන් කළ හැක්කේ මණ්ඩලයේ පාලනයන් හා නියමයන්ට යටත්වය.

6. (1) ආයතන සතුවම ආයතනයටම මුද්‍රාවක් තිබිය යුතු අතර එය අධ්‍යක්ෂ භාරයේ තබාගත යුතුය. ආයතනයේ මුද්‍රාව

(2) මණ්ඩලයේ සභාපති හා තවත් එක් සාමාජිකයෙක් ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛණයකට හෝ ආයතනයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛණයට තම අත්සන් තැබිය යුතුය.

(4) මුද්‍රාව තබන ලේඛණ හා ලියවිලි පිළිබඳ ලේඛණයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතුය.

(1) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් 5 කු විය යුතුය.

(2) අවම වශයෙන් මසකට එක් වතාවක්වත් මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතුය.

(3) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීම් හෝ මණ්ඩලයට යම් සාමාජිකයෙකුට පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් හේතු කොටගෙන මණ්ඩලයේ ක්‍රියාවක් හෝ තීරණයක් බල රහිත වන්නේ

යයි නොසලැකිය යුතුය.

(4) මණ්ඩලයේ සාමාජිකයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි පාරිශ්‍රමික හා දීමනා ලබා ගැනීම සඳහා හිමිකම් ඇත.

(5) ආයතනය වෙනුවෙන් කරනු ලබන විශේෂ සේවාවන්, දේශන හා දයකවීම් සඳහා එවැනි වෙනත් සේවාවන් වෙනුවෙන් පළාත තුළ සෙසු අයට කරනු ලබන ගෙවීම සැලකිල්ලට ලෙන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ගෙවීම් ලබා ගැනීමට මණ්ඩලයේ සාමාජිකයන්ට හිමිකම් ඇත.

(6) මෙම ප්‍රඥප්තියේ අරමුණු වලට ආදළ යෝජනා හෝ මාර්ගෝපදේශ ලබාදීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය.

(7) මණ්ඩලයට අවශ්‍ය යයි හැඟී යන ඕනෑම අවස්ථාවක ප්‍රඥප්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන උපදෙස් හා සේවාවන් ලබාගැනීම සඳහා අවශ්‍ය බලය මණ්ඩලය සතු වේ.

## 3 වන කොටස

## ආයතනයේ අරමුදල

8\. (1) ආයතනයට අරමුදලක් තිබිය යුතුය. ආයතනයේ අරමුදලට — ආයතනයේ අරමුදල

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා බස්නාහිර පළාත් සභාව විසින් කලින් කලට සම්මත කරනු ලබන මුදල්,

(ආ) ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කටයුතු කිරීම හා කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් ආයතනයට ලැබෙන සියළු මුදල්

(ඇ) ශ්‍රී ලංකාවෙන් හෝ ඉන් පිටත හෝ කවර හෝ ප්‍රභවයන්ගෙන් ණය පරිත්‍යාග ත්‍යාග හෝ ප්‍රධාන හෝ වෙනත් ආකාරයකින් ලැබෙන

සියළු මුදල්

(ඈ) ආයතනය සතු දේපළ, වත්කම්, භාණ්ඩ හා උපකරණ විකිණීමෙන් කුලියට දීමෙන්, බදු දීමෙන් හෝ බැහැර කිරීමකින් ලැබෙන මුදල්

(ඉ) ආයතනය සතු මුදල් ආයෝජනය කිරීමෙන් හෝ තැන්පත් කිරීමෙන් ණයට දීමෙන් ලැබෙන පොලී, ලාභය, වාරිකය හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල්

(ඊ) යම් විශේෂ ව්‍යාපෘති ඉටු කිරීම හෝ යම් කාර්යයන් ඉටුකර දීම සඳහා හෝ පළාත් සභා අරමුදලින් හෝ පළාත් පාලන ආයතන වලින් හෝ වෙනත් ආයතනයකින් ලැබෙන මුදල්

(උ) වෙනත් කවර හෝ නීත්‍යානුකූල ප්‍රභවයකින් ආයතනයට ලැබෙන මුදල්

(2) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී, කටයුතු කිරීමේදී හා කාර්යයන් ඉටු කිරීමේදී ආයතනය විසින් දැරිය යුතු යැයි මණ්ඩලය අදහස් කරන සියළු වියදම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

09. (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(2) ආයතනයේ ආදයම් හා වියදම් සම්බන්ධයෙන්ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන්ද මණ්ඩලය විසින් නියම කරනු ලබන ගිණුම් හා පොත්පත් පවත්වාගෙන යා යුතුය.

(3) සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අරමුදල් ලැබීම් හා ගෙවීම් ගිණුමද ආදයම් හා වියදම් ගිණුමද ශේෂ පත්‍රයද පිළියෙළ කළ යුතුය. එම ගිණුම් ඊළඟ වර්ෂයේ ජුනි 30 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතුය.

(4) සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සියළු වත්කම්,දේපල මණ්ඩලය විසින් පත්කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක අධීක්ෂණයට භාජනය විය යුතුය.

(5) ආයතනය ආරම්භ වී ලබන ඊළඟ ජනවාරි මස 1 තෙක් පටන්ගෙන සෑම වර්ෂයක් සඳහාම ඇස්තමේන්තුවක් පිළියෙළ කර වර්ෂය ආරම්භ පළමු මණ්ඩල රැස්වීමේදී ඊළඟ අනුමැතිය ලබා ගත යුතුය.

(6) ආතනයේ ගිණුම් පළාතේ ප්‍රධාන ලේකම්ගේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට ලක්කළ හැකිය.

(7) ආයතනයේ ගිණුම් විගණකාධිපතිගේ විගණනයට යටත් වේ. විගණකාධිපතිගේ විසින් එවනු ලබන වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා විසින් පළාත් සභාව වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය.

(8) ආයතනයේ ගිණුම් විගණනය සඳහා විගණකාධිපති විසින් වැය කරනු ලබන මුදල් ආයතනයේ අරමුදලින් ගෙවිය හැකිය.

මෙම ප්‍රඥප්තිය යටතේ ආයතනයේ බැදීම් ඉටු කිරිම සඳහා හෝ ආයතනයේ කාර්යයන් ඉටු කිරීම සඳහා හෝ මණ්ඩලයට අවශ්‍ය වන මුදල් ණයක් හෝ අයිරාවක් මාර්ගයෙන් රජය පිළිගත් මූල්‍ය ආයතනයක් මගින් ලබාගත හැකිය. ණය ලබා ගැනීමේ බලතල

**<u>4 වන කොටස</u>**

**<u>කාර්ය මණ්ඩලය</u>**

(1) ආයතනය සඳහා අධ්‍යක්ෂවරයෙකු සිටිය යුතුය. ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාවේ හෝ තාවකාලිකව නිදහස් කරන ලද රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු මේ සඳහා පත් කළ යුතුය. ඔහු ඕනෑම අවස්ථාවක ඔහුගේ නිත්‍ය තනතුරට ආපසු යැවීමේ බලය ගරු ආණ්ඩුකාරවරයා සතුය.

(2) ආයතනයේ කටයුතු අධීක්ෂණය කිරීම, ආයතනයේ බලතල කටයුතු සහ

කාර්යයන් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කරීම සහ ආයතනයේ සේවා නියුක්තයන්ගේ පරිපාලනය මණ්ඩලයේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂවරයා වෙත බාරදිය යුතුය.

(3) කාර්ය මණ්ඩලයේ කටයුතු හෝ කාර්ය අතුරින් කලින් කල පැවරීමට අවශ්‍යයැයි අධ්‍යක්ෂවරයා සලකන මේ බලතල කටයුතු හෝ කාර්යයන් මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් ආයතනයේ වෙනත් යම් සේවා නියුක්තිකයකු වෙත ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි අතර එවැනි යම් බලතල කටයුතු හෝ කාර්යය පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් ඒ බලතල කටයුතු හෝ කාර්යයන් අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධි විධාන වලට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

(4) රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ සහ පළාත් රාජ්‍ය සේවා කොමිසමේ සහ අදාළ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව ස්ථිර පදනම ඇතිව හෝ නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමාවක් සඳහා ආයතනයට පත් කළ හැක.

(5) ඉහත (1) උප වගන්තියට අනුව තාවකාලිකව පත් කරනු ලැබූ නිලධාරියෙකු සේවකයකු එසේ පත්කළ දින සිට මාස 6 ක කාලයක් ආයතනයේ සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවට මණ්ඩලයට තීරණය කළහොත් එසේ තීරණය කරනු ලබන දිනයේ සිට ඔහුගේ සාමාන්‍ය වැටුපට අමතරව ඔහුගේ නිත්‍ය තනතුරේ වැටුපෙන් 3/1 කට නොවැඩි මාසික දීමනාවක් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවිය හැකිය. මෙම පත්වීම වර්ෂ දෙකකට සීමාවන අතර ඉහත 1 සහ 4 අනුව නැවත පත්කිරීමට සුදුසුකම් ලබනු ඇත.

## 5 වන කොටස

## පොදු කරුණු

12. (1) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටුකිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් ප්‍රඥප්තිය යටතේ ආයතනය වෙත කලින් කල පොදු හෝ විශේෂ විධාන කරනු ලැබිය හැකිය. අමාත්‍යවරයා විසින් නියෝග නිකුත් කළ හැකි බව

(2) ආයතනයේ දේපළ කටයුතු සහ ක්‍රියා සම්බන්ධයෙන් තමාට අවශ්‍ය වන තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඕනෑම තැනැත්තෙකුට කලින් කල ලියවිල්ලකින් විධාන කළ හැකි අතර, එම තැනැත්තා විසින් එවැනි නියෝග සියල්ලක්ම පිළිපැදිය යුතුය.

13. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සහ විධි විධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට නියෝග සාදනු ලැබිය හැකිය. රෙගුලාසි

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කරනු ලබන පරිදි යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි එය අනුමත කරනු නොලැබූ දින සිට පරිච්ජින්න වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ජින්න වුවහොත් එසේ පරිච්ජින්න වූ දිනය ලෙස සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

14. මෙම ප්‍රඥප්තියේ කර්තව්‍ය පිළිබඳ ගිවිසුම් වලට එළඹීමට හා ගිවිසුම් අත්සන් කිරීමට ඒවා බලාත්මක කිරීමට මණ්ඩලයට මණ්ඩලයේ සාමාජිකයන්ට හෝ මණ්ඩලය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධාරීන්ට කළ හැක. කොන්ත්‍රාත් ආදිය

15. ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛණ ගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධි විධාන ඒ අනුව තේරුම් ගත යුතුය. ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛණ ගත ආයතනයක් ලෙස සළකනු ලැබිය යුතු බව

16. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් පදයක හෝ පදවල අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස එය මේ ප්‍රඥප්තියෙහි: අර්ථ නිරූපණය

18. "පළාත් සභාව" යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් වේ.

"සාමාජිකයා" යන්නෙන් මණ්ඩලය සඳහා පත් කරනු ලබන හා රාජ්‍ය සේවයේ යම් තනතුරක් දැරීම නිසා මණ්ඩලයේ සේවය කරන කවර හෝ පුද්ගලයකු අදහස් වේ.

"මණ්ඩලය" යන්නෙන් ප්‍රඥප්තියේ 4 වන වගන්තිය යටතේ සමන්විත කළමනාකරණ මණ්ඩලය අදහස් වේ.